// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1816/26 - 2013 ජුනි මස 26 වැනි බදාදා - 2013.06.26

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා. කා. අංකය ៖ සීඑස්ජී/7/8/14.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ.

1. විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සෙයිඩ් ඉශ්රාට් ඉමාම් මැතිතුමා
2. ධම්මික කිතුල්ගොඩ මැතිතුමා
3. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා

වෙත ៖

ශුභාශිංසන පෙරටුවයි !

මාතලේ මහරෝහල් පරිශ්‍රයේ මුළුතැන්ගෙය අසල කැණීම් කටයුතු කිරීමේදී 2012 නොවැම්බර් මස 26 වැනි දින මානව ඇට සැකිළි කිහිපයක් හමුවී ඇති හෙයින් ද, ඒ පිළිබඳව තවදුරටත් පරීක්ෂා කරමින් 2013 පෙබරවාරි මස 12 වැනි දින දක්වා කරන ලද කැණීම් කටයුතුවලදී මානව ඇටසැකිළි 155ක් හෝ ඊට ආසන්න සංඛ්‍යාවක් සොයාගැනීමට හැකිව ඇති හෙයින් ද,

එකී මානව ඇටසැකිලි කුමන පුද්ගලයින්ගේ ද, ඔවුන් කුමන ආකාරයකින් මරණයට පත් වී ද සහ කුමන වකවානුවක මිහිදන් කරන ලද්දේ ද යන්න පිළිබඳව නිශ්චිතව කරුණු අනාවරණය වී නොමැති හෙයින් ද,

තවද, එකී මානව ඇටසැකිළිවලට අදාළ සිරුරු කුමන කාලවකවානුවක කවුරුන් විසින් කුමන ආකාරයකින් මිහිදන් කරන ලද්දේ ද, එකී මානව ඇටසැකිළි කුමන පුද්ගලයන්ගේ ද සහ ඔවුන් කුමන ආකාරයකින් මරණයට පත්වී ද යන්න හඳුනාගැනීම අවශ්‍යව ඇති හෙයින් ද,

තවද, එකී මිනිස් සිරුරු නීතිවිරෝධී ක්‍රියාවක හෝ ක්‍රියාවන්හි ප්‍රතිඵලයක් වශයෙන් මිහිදන් කරනු ලැබුවේ ද, එසේනම් ; යම් තැනැත්තකු හෝ තැනැත්තන් ඒ සඳහා වගකිව යුතුද යන වග සොයා බැලීම අවශ්‍යව ඇති හෙයින් ද,

තවද, සිදුවී යැයි කියනු ලබන ක්‍රියා අනාගතයේ දී සිදුවීම වැළැක්වීම සඳහා කවර පියවර ගතයුතු ද යන්න නිශ්චය කිරීම පිණිස පරීක්ෂණ පැවැත්වීම, මහජන ආරක්ෂාවට සහ සුභසිද්ධියට හේතු වෙතැයි මගේ මතය වන හෙයින් ද,

මෙහි මින්මතු සඳහන් කරනු ලබන කරුණු පිළිබඳව විමර්ශන පවත්වා වාර්තා කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍යයැයි මා හට පෙනී යන හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය, ස්වාධීනතාව සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් (393 වැනි අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (2) වැනි වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව ඉහත කී :

1. විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු ගරු සෙයිඩ් ඉශ්රාට් ඉමාම් මැතිතුමා
2. ධම්මික කිතුල්ගොඩ මැතිතුමා
3. විශ්‍රාමික මහාධිකරණ විනිසුරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා

වන ඔබතුමන්ලා, මතු දැක්වෙන කරුණු පිළිබඳව, එනම් :

1. ඉහත කී මානව ඇටසැකිළි සහ/හෝ ඊට අදාළ සිරුරු කුමන කාලයක මිහිදන් කරන ලද්දේ ද යන්න හඳුනාගැනීම ;
2. ඉහත කී මානව ඇටසැකිළි කුමන පුද්ගලයන්ගේ ද යන්න හඳුනාගැනීම ;
3. ඔවුන් මරණයට පත්වූ වකවානුව හා කුමන හේතුවක් මත කුමන ආකාරයකින් මරණයට පත්වූයේ ද යන්න හඳුනාගැනීම ;
4. ඔවුන් මරණයට පත්වූයේ නීත්‍යානුකූල නොවන ක්‍රියාවක් හෝ ක්‍රියාවන් හේතුවෙන් නම්.

   (අ) ඒ සඳහා වගකිවයුතු තැනැත්තකු හෝ තැනැත්තන් හඳුනා ගැනීම සඳහා ප්‍රමාණවත් විශ්වාසනීය කරුණු හෝ සාක්ෂි ;
   (ආ) එසේ වගකිවයුතු යැයි නිශ්චය කෙරෙන තැනැත්තකු හෝ තැතැත්තන්ට විරුද්ධව ගනු ලැබිය හැකි නීතිමය ක්‍රියාමාර්ග ;
   (ඇ) එවන් නීති විරෝධී ක්‍රියාවක් හෝ ක්‍රියාවන් අනාගතයේ දී සිදුවීම වැළැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ;
   (ඈ) එසේ මරණයට පත්වූයේ යැයි හඳුනාගනු ලබන පුද්ගලයන්ගේ දෙමාපියන්ට, කලත්‍රයන්ට සහ යැපෙන්නන්ට රජයේ වගකීමක් ලෙස සැළසිය යුතු සහන කිසිවක් තිබේ නම් එකී සහන.

පරීක්ෂා කොට, වාර්තා කරනු පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙසින් මෙමගින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී ගරු සෙයිඩ් ඉශ්රාට් ඉමාම් වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පෙර කී කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි යැයි ඔබට පෙනී යන එබඳු සියලු පරීක්ෂණ පැවැත්වීමට ද, එබඳු සියලු විමර්ශනයන් කිරීමට ද, ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබතුමන්ලාට මා මෙයින් මගේ බලය හා අධිකාරය පවරන අතර, මේ අධිකාරී පත්‍රයෙහි දින සිට හය මසක් ඇතුළත ඔබේ පරීක්ෂණයන්හි නිගමනයන් හා ඒවාට අදාළ ඔබේ නිර්දේශයන් ඇතුළත් වාර්තාවක් ඔබේ අත්සනින් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණාවලට අදාළ වන කිසියම් පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම් එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතුයැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ පරීක්ෂණයන්හි හෝ විමර්ශනයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත් කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද, මෙයින් නියම කොට විධාන කරමි.

තවද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 14 වන වගන්තියෙහි විධිවිධාන මෙම කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස් දහතුනක් වූ ජුනි මස විසි වැනි දින වන මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

07 – 308

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.